# අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

IFSLS

## පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය
## 11 වන බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම
## 2023/ 2024/ 2025 වර්ෂ වලදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් සිසුන් සඳහා

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශය මඟින්, සුදුසුකම් සපුරන ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් අතරින් පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (IFSLS) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් උපාධි පිරිනමනු ලබන ආයතන මඟින් මෙහෙයවනු ලබන තෝරාගත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මෙමඟින් අවස්ථාව සලසනු ලබයි.

### අයදුම්පත් ඉදිරිපත් කිරීම

සුදුසුකම් ලත් අපේක්ෂකයින් www.studentloans.mohe.gov.lk මඟින් මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

### උපාධි පාඨමාලා

සියලුම උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවනු ලබන අතර, www.studentloans.mohe.gov.lk වෙබ් අඩවියෙහි පළකොට ඇති ශිෂ්‍ය අත්පොත මඟින් අදාළ උපාධි පාඨමාලා ලැයිස්තුවට යොමුවිය හැක.

### අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය

ආරම්භක දිනය : 2026.08.17
අවසන් දිනය : 2026.09.27

### සුදුසුකම්

i. 2023 / 2024 / 2025 වර්ෂ වලදී අ.පො.ස. (උ/පෙළ) විභාගයට අනුමත විෂයන් 3ක් සඳහා තෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) 3ක් එක්වර ලබා තිබීම. **සහ**

ii. ඉහත (i) හි විස්තර කොට ඇති ඕනෑම වරකදී සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා අවම වශයෙන් ලකුණු 30ක් ලබා තිබීම. **සහ**

iii. අ.පො.ස. (උ/පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට සාමාන්‍ය (S) සාමාර්ථයක් හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම. **සහ**

iv. අයදුම්කරුවන්ගේ වයස 2026.09.27 වන දිනට අවුරුදු 25 හෝ ඊට අඩුවීම.

### වෙනත් සුදුසුකම්

උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වීමේ අනෙකුත් සුදුසුකම් දැනගැනීමට www.studentloans.mohe.gov.lk හි ශිෂ්‍ය අත්පොත පරිශීලනය කරන්න.

### තෝරා ගැනීමේ නිර්ණායකයන්

අදාළ පාඨමාලා සඳහා තෝරා ගැනීම පහත සඳහන් කරුණු මත පදනම් වේ.

i. අයදුම්කරු විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම්.

ii. උපාධි පාඨමාලාව සඳහා අයදුම්කරුවන් වෙත සඳහන් කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙල.

iii. අදාළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත එක් එක් උපාධි පාඨමාලාව සඳහා නිර්දේශ කොට ඇති ආසන ධාරිතාව.

iv. ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව අදාළ ආයතනයේ එක් එක් උපාධි පාඨමාලාව සඳහා වන ආසන ධාරිතාවය ඉක්මවා යන විටදී අයදුම් කරුවන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ලබාගත් Z- අගය මත තේරීම් සිදු කෙරේ.

### උපරිම ණය ප්‍රමාණයන් රු. 1,500,000.00

උපාධි පාඨමාලා සඳහා ලබා දෙනු ලබන උපරිම ණය මුදල විෂය ධාරාව අනුව තීරණය වී ඇත. උපරිම ණය සීමාවන් දැනගැනීම සඳහා www.studentloans.mohe.gov.lk වෙත පිවිස ශිෂ්‍ය අත්පොත පරිශීලනය කරන්න. එම ණය සීමාව යටතේ පාඨමාලාව සම්පූර්ණයෙන් හදාරා අවසන් කිරීමට හැකියාව පවතී. මීට අමතරව ශිෂ්‍යයාගේ කැමැත්ත මත වසරකට රු.75,000ක ශිෂ්‍යාධාර ණය මුදලක් ද පොලී රහිතව ලබා ගත හැක.

<u>වැඩි විස්තර සඳහා අමතන්න</u>
අධ්‍යක්ෂ,
ශිෂ්‍ය ණය අංශය,
රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය,
අංක 980/4A,
වික්‍රමසිංහ පෙදෙස, ඇතුල්කෝට්ටේ.

E: dsls@mohe.gov.lk
W : www.mohe.gov.lk
M : 070 355 59 70 / 979
: 070 355 59 79
: Interest free student loans scheme

### ණය නිකුත් කිරීම

වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා www.studentloans.mohe.gov.lk හි ශිෂ්‍ය අත්පොත පරිශීලනය කරන්න.

### ශිෂ්‍ය වගකීම්

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන සියලුම සිසුන් උපාධි පාඨමාලාවේ සෑම අනිවාර්ය විෂයයක් සඳහාම අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) පාඨමාලා කාලසීමාව තුළ ලබාගත යුතු අතර, ඔවුන්ගේ අධ්‍යයන කාලය තුළ 80% පැමිණීම පවත්වා ගත යුතුය.

### ණය ආපසු ගෙවීම

සම්පූර්ණ ණය කාලසීමාව වසර 12 කි. ඒ සඳහා වන සම්පූර්ණ පොලිය රජය විසින් ගෙවනු ලබයි. අධ්‍යයන කාලසීමාව හා එක් වසරක අමතර සහන කාලයකට පසුව, ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

වසර 4/ 3 පාඨමාලාවන් සඳහා වූ සම්පූර්ණ ණය මුදල පිළිවෙලින් වාරික 84/96 කින් ගෙවා අවසන් කළ යුතුය.

Scan Me

### පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයේ 11වන බඳවා ගැනීමට අදාළ උපාධි පිරිනමනු ලබන ආයතන

SLIIT, NSBM Green University Town, CINEC Campus, SIBA Campus, CA, ESOFT Metro Campus, BCI Campus, Institute of Chemistry Ceylon, Horizon Campus, KIU, BMS, SLTC, saegis, ICBT Campus, Lyceum Campus, NIIBS